**අතුරලිය ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**

---

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 ජූලි 15 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 28 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට අතුරලිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.4,687,096 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ රු.1,538,939 ක් වූ සැපයුම් හා උපකරණ වියදම් රු.506,166ක් ලෙස දැක්වීම නිසා, පුනරාවර්තන වියදම් රු.1,032,743 ක් අඩුවෙන් දැක්වුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ රු.3,233,679 ක් වූ ප්‍රාග්ධන වැය රු.8,659,716 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා, ප්‍රාග්ධන වැය රු.5,426,037 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර ණයගැතියෝ රු.3,202,771 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඉ) සංවර්ධන වැඩ යෝජනා 05 ක් වෙනුවෙන් ගෙවිය යුතු ප්‍රාග්ධන වැය රු.2,884,913 ක් හා ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර රු.3,560,874 ක් වැඩියෙන් දැක්වුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට එකිනෙක සමාන විය යුතු ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය අතර රු. 889,359 ක වෙනසක් විය.

(උ) සමාලෝචිත වර්ෂයේ ආදායම් එකතුව රු.609,133ක් වැඩියෙන්ද, වියදම් එකතුව රු.6,133,246 වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම**

**------------------------**

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.10,409,491 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළ ශේෂ සහ ඊට අදාළ උපයෝගී ලේඛන / උපලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුව රු.4,106,266 ක අසමානතා පවතින බව නිරීක්ෂණය විය.

**1.3.3 ගෙවිය යුතු ගිණුම්**

---------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.7,152,840 ක් වූ ප්‍රාග්ධන ආධාර ණයහිමි ශේෂය තුළ, වර්ෂ 03 ක කාලයක් ඉක්මවා තිබූ රු.150,000 ක් වූ ශේෂ ඇතුළත් වී තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාව ස්ථාපිත කිරීමේදී පවරාගත් දේපළ වෙනුවෙන් අකුරැස්ස ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු රු.675,577 ක මුදල සමාලෝචිත වර්ෂයේ අවසානයටද නිරවුල් කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි නොවීම**

**-------------------------------------------**

එකතුව රු.102,733,132 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් හිමිකම් ඔප්පු, යාවත්කාලීනව හා විධිමත්ව පවත්වන ලද ස්ථාවර වත්කම් ලේඛනය හා සමීක්ෂණ මණ්ඩල වාර්තා ද, එකතුව රු.15,907,617 ක් වූ හිඟහිටි ආදායම් ගිණුමේ ශේෂය හා එකතුව රු.7,152,840 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂය සම්බන්ධයෙන් ණයහිමි ලේඛන කාල විශ්ලේෂණ හා විස්තරාත්මක උපලේඛනද, එකතුව රු.1,121,281 ක් වූ බැංකු ශේෂ සම්බන්ධයෙන් ශේෂ සනාථ යනාදී සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම්

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 570, 571 පරිදි වසර 02 ක කාලයක් ඉක්මවා තිබුණු එකතුව රු.830,424 ක් වූ තැන්පතු ශේෂ 69 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.3,661,952 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.6,182,783 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,520,831 ක පහත වැටීමක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) මුළු පුනරාවර්තන ආදායමින් සියයට 86.97 ක් ඉක්ම වූ මුළු පුනරාවර්තන වියදම් පැවතීම නිසා සභාවේ ආදායමට සාපේක්ෂව වියදම ඉතා ඉහළ මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

(ආ) ස්වයං උත්පාදිත ආදායම ඉක්මවා සමාලෝචිත වර්ෂයේ මෙන්ම ඉකුත් වර්ෂ දෙකෙහිද සැලකිය යුතු ඉහළ අගයන්ගෙන් වැඩිවන වේගයකින් පුනරාවර්තන වියදම් වැඩිවී තිබූ අතර, ආදායම් ආධාර නොලැබෙන්නට, ස්වයං උත්පාදන ආදායම් වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට කිසිදු ආකාරයකින් හැකියාව නොලැබෙන බව ඉකුත් වර්ෂ තුන තුළම පෙන්නුම් කෙරුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 වරිපනම් හා බදු

**(අ) වරිපනම්**

ආරම්භක හිඟය රු.853,486 ක් වූ අතර, රු.611,970 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.1,465,456 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.614,252 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.851,203 ක හිඟ ශේෂයක් පැවතුණි.

(ආ) **අක්කර බදු**

ආරම්භක හිඟය රු.48,412 ක් වූ අතර, රු.12,345 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.60,757 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.21,753 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.39,004 ක් හිඟව පැවතුණි.

## 2.3.2 බදුකුලී

ආරම්භක හිඟය රු.44,130 ක් වූ අතර, රු.2,960,000 ක් වූ බිල්කිරීම් සමග රු.3,004,130 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.2,991,727 ක් වූ නිසා, වර්ෂය අවසානයට රු.12,403 ක් හිඟව පැවතුණි.

## 2.3.3 මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.14,223,187 ක් ලැබිය යුතුව තිබුණි.

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්ය සාධන ඇගයීම

2016 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ප්‍රාග්ධන වියදම් රු.121,064,000 ක් වූ නමුත්, තථ්‍ය ප්‍රාග්ධන වියදම රු.8,832,259 ක් හෙවත් ඇස්තමේන්තුගත අගයෙන් සියයට 7.29 ක් තරම් පහළ අගයක් විය.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

ද්විතීයික හා ප්‍රාථමික තනතුරුවල පැවති පුරප්පාඩු 04 ක් පුරවා ගැනීමටත්, 11 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි.

## 3.3 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) රු.11,361 ක් වූ හිඟ කඩ කුලී මුදලක් අය කර ගැනීම සඳහා 2008 අගෝස්තු 19 දින සිට සභාව විසින් රු.38,675 ක නීතිඥ ගාස්තු ගෙවීම් කර තිබුණද, හිඟ මුදල විගණන දිනය වන විටත් අයවී නොතිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (එ) වගන්තියට අනුකූල නොවී කාර්යමණ්ඩල සුභසාධන සංගමයේ කාර්යයන් සඳහා සභා අරමුදලින් රු.100,000 ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) වෙන්දේසි ඉඩම්වලින් පොදු පහසුකම් සඳහා සභාවට ලැබිය යුතු ඉඩම් ප්‍රමාණය පර්චස් 78.53 ක් වුවද, ලබාදී තිබූ ඉඩම් ප්‍රමාණය පර්චස් 56 ක් පමණක් වීම නිසා එම ඉඩමේ විකුණුම් වටිනාකම මත සභාවට රු.506,926 ක අලාභයක් සිදු වී තිබුණි.

## 3.4. නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

(අ) 2015 අප්‍රේල් 01 දින සභාවට ලැබුණු පර්චස් 56 ක් වූ ඉඩම කිසිඳු ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා නොගැනීම නිසා නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) සභාවට අයත් පිරිවැය රු.3,069,218 ක් වූ ට්‍රැක්ටර් 03 ක් වර්ෂ 10 කට වැඩි කාලයක සිට නිෂ්ක්‍රීයව පැවති නමුත්, ඒවා අළුත්වැඩියා කර ධාවනයට යොදවා ගැනීමට හෝ 2015 ජූලි 10 දිනැති අංක 2/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) 2016 ජූලි 21 දින සභාවට ලැබී තිබූ රු.24,928,666 ක් වූ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය එදින සිට නිෂ්කාර්යව පැවතුණි.

## 3.5. කොන්ත්‍රාත් පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයට අනුව විවිධ ප්‍රතිපාදන හා සභා අරමුදල් යටතේ රු.119,951,000 ක් වූ වැඩ යෝජනා 130 ක් ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර තිබුණද, වර්ෂය තුළ ඉන් කිසිඳු වැඩයෝජනාවක් හෝ ඉටුකර නොතිබුණි. එහෙත්, ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණු රු.6,653,660 ක් වූ කර්මාන්ත 16 ක් වෙනත් ප්‍රතිපාදන මත ඉටු කර තිබුණි.

## 3.6. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) කසළ එකතු කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.4,639,916 ක් හා පසුගිය වර්ෂ 05 තුළ රු.16,466,490 ක වියදමක් දරා තිබුණු නමුත්, එකතු කරන ලද කසළ ප්‍රමාණය ගණනය කිරීම හෝ වර්ග කිරීමකින් තොරව පෞද්ගලික ඉඩමකට බැහැර කර තිබුණි.

(ආ) අංක 1533/16 හා 2008 ජනවාරි 25 දින චක්‍රලේඛය අනුව පරිසර බලපත්‍රය ලබාගෙන නොතිබුණි.

## 3.7. පාරිසරික බලපෑම

2008ජනවාරි 25දිනැති අංක 1533/ 16දරන ගැසට් නිවේදනයට අනුව ආයතන 32 ක් විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා නොගැනීම නිසා, සභාවට රු.140,800 ක අදායම් අහිමි වී තිබුණි. එමගින් පරිසරයට සිදුවියහැකි අහිතකර බලපෑම්වලට එරෙහිව සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත්, වැය විෂයයන් 07 ක එකතුව රු.6,415,605 ක් වූ ඉතිරිවීම්ද, ආදායම් විෂයයන් 04 ක ළඟා නොවූ ඉලක්කයන්ගේ එකතුව රු.5,773,796 ක් ද, පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 4.2 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණ අතර සභාව විසින් පත් කර තිබූ අභ්‍යන්තර විගණන නිලධාරියාට සමාලෝචිත වර්ෂයේදී රු.371,721 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**5.** **පද්ධති හා පාලනයන්**

------------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් රැස්කිරීම

(ඇ) වත්කම් කළමනාකරණය